SC...

# 1997 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් ප්‍රාථමික අධ්‍යාපනයට හඳුන්වා දෙන ලද සෙල්ලම් මිදුල පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්

( රඹුක්කන අධ්‍යාපන කොට්ඨාසය ඇසුරෙනි.)

**ජී. ආර්. කරුණාතිලක**
ශාස්ත්‍රවේදී
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා

අධ්‍යාපනපති පාඨමාලාව 2002/2003

*අධ්‍යාපනපති උපාධියේ අවශ්‍යතා පූර්ණය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධනය.*

ශිෂ්‍ය අංකය 60207745,
අධ්‍යාපන අධ්‍යයන අංශය,
අධ්‍යාපන පීඨය,
ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය.

OPEN UNIVERSITY
66962

**2005** ජනවාරි

66962

## සාරාංශය

වර්ෂ 1997 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලින් ප්‍රාථමික අධ්‍යාපනයට හඳුන්වා දෙන ලද සෙල්ලම් මිදුල පිළිබඳව විමර්ශනය සඳහා මෙම අධ්‍යයනය යොමු විය.

දැනට භාවිතා වන සෙල්ලම් මිදුල්වල පිහිටීම හා ඉඩකඩ පිළිබඳ විමසා බැලීම, සෙල්ලම් මිදුලේ ඇති අංග වලට 1,2 ශ්‍රේණිවල සිසුන්ගේ කැමැත්ත විමසා බැලීම, 1,2 ශ්‍රේණිවල සිසුන් ප්‍රිය කරන සෙල්ලම් /ක්‍රීඩා සඳහා ගැළපෙන අංග සෙල්ලම් මිදුලේ තිබේදැයි විමසීම, සෙල්ලම් මිදුල සඳහා යෝජිත අංග 1,2 ශ්‍රේණිවල සිසුන්ගේ කායික වර්ධන අවස්ථා හා ගැළපේද ? විමසීම. සෙල්ලම් මිදුල 1,2 ශ්‍රේණිවල සිසුන්ගේ චර්යා කෙරෙහි කරන බලපෑම පිළිබඳව දෙමාපිය, ගුරු, සිසු සංජානන විමසීම, සෙල්ලම් මිදුල 1,2 ශ්‍රේණිවල සිසුන්ට ආරක්ෂිත ස්ථානයක් වේද, විමසා බැලීම සහ සෙල්ලම් මිදුල භාවිතයට ගැනීම පිළිබඳව ගැටලු පැන නැගී ඇත්දැයි විමසීම මෙම අධ්‍යයනයේ අරමුණු වේ.

කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල අධ්‍යාපන කලාපයේ රඹුක්කන අධ්‍යාපන කොට්ඨාසයේ පාසල් දහයක් ඇසුරෙන් මෙම අධ්‍යයනය කරන ලදි. 1,2 ශ්‍රේණිවල සිසුන් අසූවක්, ගුරුවරුන් විසිදෙනෙකු හා දෙමාපියන් විසි දෙනෙකු නියැදියට අයත් විය. ඔවුන්ගෙන් තොරතුරු ලබාගැනීමේදී 1, 2 ශ්‍රේණිභාර ගුරුවරුන්ගෙන් ප්‍රශ්නාවලියක් මගින් තොරතුරු ලබාගත් අතර නියැදියට අයත් සිසුන්ගෙන් හා දෙමව්පියන්ගෙන් තොරතුරු ලබා ගැනීමේදී සම්මුඛ සාකච්ඡා යොදාගනු ලැබීය. නියැදියට අයත් පාසල්වල සෙල්ලම් මිදුල් නිරීක්ෂණය කිරීමද සිදුවිය.

අධ්‍යයනය සඳහා යොදාගත් පාසල්වල සෙල්ලම් මිදුල්වල පිහිටීම හා ඉඩකඩ සලකා බලන කල පාසල් හතරක සෙල්ලම් මිදුල්වල පිහිටීම සෙල්ලම් මිදුලකට අයෝග්‍ය බව දැකගන්නට ලැබුණි. සෙල්ලම් මිදුල් තුනක් 1,2 ශ්‍රේණිවල පන්ති කාමරයේ සිට පන්ති භාර ගුරුවරයාට නිරීක්ෂණය කළ නොහැකි ආකාරයෙන් පිහිටා තිබිණි.සෙල්ලම් මිදුල්වල ඉඩකඩ ප්‍රමාණය ඒ ඒ පාසල්වල 1,2 ශ්‍රේණිවලින් එක් ශ්‍රේණියක සිසුන් සංඛ්‍යාව හා සසඳා බලනකල ප්‍රමාණවත් වෙයි.

නියැදියේ සෑම පාසලකම එක් අවස්ථාවකදී සෙල්ලම් මිදුල භාවිතයට ගන්නේ එක් පන්තියකි. සිසුන් නියමිත ප්‍රමාණය ඉක්මවා සිටින පාසල්වල ඉඩකඩ ප්‍රමාණවත් නොවන බව අනාවරණය විය. නියමිත පරතරයක් නොතබා අක්‍රමවත්ව උපකරණ ස්ථානගත කර ඇති බවක්ද අනාවරණය විය. අධ්‍යයනය සඳහා යොදාගත් පාසල්වල සෙල්ලම් මිදුල්වල දක්නට ලැබුනේ උපකරණ හතරක් හෝ පහක් පමණි. එක් පාසලක පමණක්

උපකරණ හතක් දක්නට ලැබුණි. සෙල්ලම් මිදුල සඳහා යෝජිත උපකරණවලට ඇතුළත් නොවුන එක් උපකරණයක් එක පාසලක තිබුණි. සෙල්ලම් මිදුලට සිසුන්ගේ කැමැත්තක් ඇත. එහෙත් සෙල්ලම් මිදුලේ තිබෙන උපකරණ කිහිපයකට පමණක් සිසුහු කැමැත්තක් දක්වති.සෙල්ලම් මිදුලේ තිබෙන උපකරණ අතරින් සිසුන් වැඩි කැමැත්තක් දක්වන්නේ ඔන්චිල්ලාවටයි. සිසුන් කැමතිම සෙල්ලම්/ ක්‍රීඩා පිළිබඳව විමසීමේදී පිරිමි ළමුන්ගෙන් 70% ක් හා ගැහැණු ළමුන්ගෙන් 80% ක් දැනට සෙල්ලම් මිදුලේ තමන් ප්‍රිය කරන අංගය වන ඔන්චිල්ලාව නැවත නම් කිරීම සිදු විය. මේ අනුව තමන් අත්දැකීම් ලබන තමා යෙදෙන සෙල්ලම්/ ක්‍රීඩා අතරින් සිසුන් ප්‍රිය කරන සෙල්ලම්/ ක්‍රීඩාව නම් කරන බව පැහැදිලිය. එබැවින් 1,2 ශ්‍රේණිවල සිසුන් ප්‍රිය කරන සෙල්ලම්/ ක්‍රීඩාව හඳුනාගැනීම සඳහා පුළුල් අධ්‍යයනයක් අවශ්‍ය බව අනාවරණය විය.

සෙල්ලම් මිදුලේ අංග 1,2 ශ්‍රේණිවල සිසුන්ගේ කායික වර්ධන අවස්ථා හා ගැළපෙන බව 1,2 ශ්‍රේණි භාර ගුරුවරුන් දැක්වූ අදහස් වලින් අනාවරණය වූ අතර සාහිත්‍ය විමර්ශනවලින් එය තහවුරු විය. එහෙත් එම උපකරණ යෝග්‍යවන්නේ සිසුන්ගේ වින්දනය සඳහා නිදහසේ භාවිතා කිරීමට නොව ප්‍රාථමික ශ්‍රේණිවල ශාරීරික
අධ්‍යාපන වැඩසටහන් සඳහා බවද අනාවරණය විය.

සෙල්ලම් මිදුලේ දී තම පන්තියේ සිටින සිසුන් එක්ව සෙල්ලම් කිරීම තුළින් සිසුන්ගේ චර්යාමය වෙනසක් ඇතිවන බව අනාවරණය විය. සෙල්ලම් මිදුල 1,2 ශ්‍රේණිවල සිසුනට ආරක්ෂාකාරී ලෙස නිදහසේ භාවිතා කළ හැකි ස්ථානයක් නොවන බව ද අනාවරණය විය. පාසල් දෙකක සෙල්ලම් මිදුල් ආශ්‍රිතව අනතුරු දෙකක් සිදුව ඇත.

සෙල්ලම් මිදුල සකස් කිරීමේ දී සිසුන්ගේ ආරක්ෂාව ගැන සලකා යෝජිත අංග ඉවත්කර ඇත. පන්තියේ වැඩ ඉක්මනින් නිමකරන සිසුන් සෙල්ලම් මිදුලට යැවීමක් ද නැත.

සෙල්ලම් මිදුල නඩත්තු කිරීම හා පවත්වාගෙන යාමද පාසල්වලට ගැටලුවක්ව ඇත. තාවකාලිකව සකස් කළ උපකරණ නිතර අබලන් වීමත්, පාසල් කාලයෙන් පසුව පැමිණෙන ළමුන්ගෙන් හානි පැමිණීමත් මෙයට හේතු විය. සෙල්ලම් මිදුල්වලට නවාංග එකතු කරමින් යළි සැකසීමේ කාලය එළඹ ඇතිමුත් ඒ සඳහා අදාළ ආයතන හා පුද්ගලයන්ගේ පෙළඹීමක් නැති බව අනාවරණය විය.